**දිවිමගට රුකුලක්**

# රැකියාවට ඔබට පුහුණුවක්

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කෙරෙන පාසැල් හැර යන්නවුන් උදෙසා කාර්මික පුහුණු පාඨමාලා මගින් කාර්මික අධ්‍යාපන ඒකකයන්හි කෘෂිකර්මය, ගොඩනැගිලි කර්මාන්තය, පාරම්පරික කර්මාන්ත, සත්ත්ව පාලනය, වාණිජ විද්‍යා කර්මාන්ත හා සේවා වැනි පූර්ණ කාලීන හා අර්ධ කාලීන පාඨමාලා පැවැත්වේ. මෙම පාඨමාලා හදරන තරුණ තරුණියන්, විශේෂයෙන්ම ස්වයං රැකියා උදෙසා පුහුණු කරනු ලැබේ. පූර්ණ කාලීන ඒකක 80 කටත්, අර්ධකාලීන ඒකක 1,000 කටත් වැඩි කාර්මික අධ්‍යාපන ඒකක සංඛ්‍යාවක් දැනට දිවයිනෙහි ඇත.

වයස අවුරුදු 15 ට වැඩි එමෙන්ම වෘත්තීය කුසලතා ලබා ගැනීමට කැමැත්තක් දක්වා පාසැල් හැර යන්නවුන් මෙම පුහුණු පාඨමාලා සඳහා බඳවා ගනු ලැබේ. සෑම දිස්ත්‍රික්කයෙහිම තෝරාගනු ලැබූ පාසැල්වල එම පාඨමාලා පැවැත්වේ. අපේක්ෂකයින්ගේ අධ්‍යාපන සුදුසුකම් ගැන නොසලකා පුහුණුව ලබාදෙන පාසලේ විදුහල්පතිවරයා විසින් අභ්‍යාස ලාභීන් (සම්මුඛ පරීක්ෂණයකින්) තෝරාගනු ලැබේ.

පාඨමාලා පිළිබඳ විස්තර

කාර්මික/වෘත්තීය පුහුණු පාඨමාලාව

කෘෂිකර්ම විද්‍යාව

ඉදි කිරීමේ කර්මාන්ත

පාරම්පරික කර්මාන්ත

සත්ව පාලනය

වාණිජ විද්‍යාව

කර්මාන්ත

සේවාවන්

කාලය: මාස 6 යි

ස්ථාන: දිස්ත්‍රික්කයන්හි තෝරාගනු ලැබූ පාසැල්

ඇතුළත් වීමේ අවශ්‍යතාවයන්: වයස 15 ට වැඩි වූ පාසැල් හැර ගිය අය විය යුතුය.

තෝරාගැනීමේ ක්‍රමය: සම්මුඛ පරීක්ෂණ මගිනි.

පුහුණුව සඳහා අය කෙරෙන ගාස්තු: කිසිදු මුදලක් අය නො කෙරේ.

මෙම පුහුණු පාඨමාලාව පිළිබඳ වැඩිදුර විස්තර පහත දක්වෙන දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් අධ්‍යාපන කාර්යාලයේ අධ්‍යක්ෂ/ප්‍රධාන අධ්‍යාපන නිලධාරි ගෙන් ලබාගත හැක.

කොළඹ, ගම්පහ, හෝමාගම, මිනුවන්ගොඩ, කළුතර, ගාල්ල, මාතර, තංගල්ල, හලාවත, කුරුණෑගල, මහනුවර, (බටහිර), මහනුවර (නැගෙනහිර), රත්නපුර, නුවරඑළිය, අනුරාධපුරය, බණ්ඩාරවෙල, මොණරාගල, මඩකලපුව, යාපනය, අම්පාර, මාතලේ, නිකවැරටිය, කුලියාපිටිය, පොළොන්නරුව, කල්මුනේ, ත්‍රිකුණාමලය, වවුනියාව, මන්නාරම සහ පුත්තලම යන දිස්ත්‍රික්කයි.